හොඳ සිංහල

වි ක ධර්මබන්ධු

බසට එකතු වී ඇති වරිය/වරියෝ, තුමිය/තුමියෝ, ඉදිය/ඉදියෝ, ඉසුරි/ඉසුරියෝ යන පද ගැන කරන විමසුමක්.

ඛඩිවර කිව්වර පඬිතුමා රජතුමා සුරිඳු කිව්දු කිව්සුරු දනිසුරු වැනි වචන අපේ බසේ බෙහෙවින් යෙදෙන සැටි ඔබ දිනිති.

පඬියා/පඬුවා කිව්යා රජා සූරයා යනුවෙන් හැඳින්වීමට වඩා ඉහත දැක්වූ හැඳින්වීම මනා බවත් ගරුව සඳහා වන බවත් පැහැදිලිය.

ඩයිවර් මහත්තයා කොන්දොස්තර මහත්තයා ඩයිවර් උන්නැහෙ බාස් උන්නැහෙ , නඩුකාර උන්නාන්සේ පාදිලි උන්නාන්සේ, යකඳුරු අප්පු, කෝකි අප්පු, වෙද රාල, ගමරාල ආදී කතා බහේ ඇසෙන මහත්තයා උන්නැහේ උන්නාන්සෙ අප්පු රාල වැනි පදවලින් දෙන්නේ ද ගරු අදහසකි.

ප්‍රතම පුරුසයේ දී (ඔහු යන අරුතින්) ගරු නම නැතිව ඔව්න් හැඳින්වුවත්, මද්‍යම පුරුසයේ දී (ඔබ යන අරුතින්) ගරු නාම නැතිව ඔව්න් අමතීම අපේ සත්සිරිතක් ලෙස සැලකීම යුතුය.

ඩයිවර් කාරෙක හේදුවාද ? කොන්දොස්තරට අද නිවාඩුයි වගේ ? බාස් හෙට එනවා නේද ? යකඳුරේ මොකෝ මේ පැත්තේ ? වැනි වහර බාවිතා කරන්නේ 'මහන්තත්වය' නිසා ඔලුව උදුම්මා ගත් අයයි. එය අපේ දෑයේ හැදියාව නොවේ. අනුන් පහත් කොට සැලකූ විට තමන් ඉහත් වෙනැයි ඔහු සිතති.

දන්නා හඳුන අසල් වැසියන් පවා (නෑයන් නොවේ) අප්පු සීයා ගිමා ආත්තා/අත්තී, ජෝම්මාමා රන්සි නැන්දා, සිරි අයියා සෝමක්කා යනුවෙන් ඇමතීමත් හැඳින්වීමත් අපට හොඳ

අද කතුන් නොකරන වැඩක් නැත. සමහර විට සැමියා ගෙදර නැවතී දරුවන් රැක බලා ගන්නා අතර අඹුව ටැක්සියක් හෝ බසයක් එලවයි (පදවයි). නොහොත් රෝහලක හෝ පොලීසියක සේවය කරයි. මේ වෙනස් කම් නිසා බසේ ද වෙනස් කම් ඇති විය.

පුරුදුය. නම පමණක් කීම ඔවුන්ට මදිකමකි.

වර ප්‍රත්‍යයේ ඇත්තේ 'උතුම්' යන ගරු අරුතයි. ගුරුවර පඬිවර කිව්වර ආදී වශයෙන් නාමයක් අගට 'වර' ප්‍රත්‍ය එකතු වේ. අප්‍රාන වාචි පුර, ගම්, යන එකම පද වලටද 'වර' එකතු වී පුරවර ගම්වර හැදේ. වරඟනන් යන තැන (වර, අඟනන්) මුලට 'වර' යෙදී ඇතත් එසේ 'වර' මුලට යෙදුනු අන් තැනක් ගැන මතකයක් මට නැත. එහෙයින් එය නෛරුක්තික විදියෙන් හැදුනක් සේ සැලකීමට සිදු වෙයි. වර ලියන් වරදනන් වැනි පද ගැන සිතා බලන්න. එබඳු යෙදුම් නැත. ඔබ කැමති නම් ඒ වහරට පන දිය හැක.

මා අද 'වර' ප්‍රත්‍යය ගැන ලියන්නට අදහස් කලේ අපට නිතර අසන්නටත් දකින්නටත් ලැබෙන 'ඔව්වරු අම්මාවරු' වැනි නවන සිහිපත් වූ නිසාය.

අපේ පැරනි පොත්වල නලුවන් සහ නිලියන්, දස්සන් සහ දැස්සන්, ගායකයින් සහ ගායිකාවන් මෙන්ම ගොවියන් සහ ගෙවිලියන් ගැන ද සඳහන් වේ. හින්දු ආගමේ අඛාසය නිසා දෙවොලේත් කෝවිලේත් නිලියන් සහ ගායිකාවන් සිටි බව පෙනේ. රජ මැදුර ද ඔවින්ට ඇරි තිබිනි. ගනිකාවන් ගැනද ඔබ අසා ඇත.

එහෙත් කිසිදු පැරනි පොතක ගත් කතුවරයන් වෙදවරියන් පඬිවරියන්, ගුරුවරියන්, ලේකම්වරියන් ගැන සඳහන් වූ තැනක් මගේ මතකයේ නැත.

ගැහැනුන්ට බුදු වීමට හෝ එසේ බුදු වීමට බැරියයි කියති. එහෙයින් බුදුවරියන් හෝ පසේ බුදුවරියන් ගැන කිසිඳු සඳහනක් ඇති නොවීම ගැන පුදුම විය යුතු නැත. පුදුමය නම් කිසිදු ගැහැනියකට 'ඉසිවරියක' වීමට බැරි වීමය. ඉසා කම ද මහලු පිරිමින්ට අරුනකි.

අද පැදි සයිකල්, මොටෝ සයිකල්, කාර්, බස් පදින - පදවන කතුන් අපට දකිත හැකිය. එහෙත් අපේ සිංහල සමාජයේ ගස් නැග කොස් පොල් කැඩූ කතුන් ගැන හෝ (මීරා සඳහා) කිතුල් පොල් ගස් මැදි කතුන් ගැන හෝ (දැව සඳහා) රාස් කපන ලී ඉරන කතුන් ගැන හෝ කරත්ත තිරික්කල දැක්කූ කතුන් ගැන හෝ අසන්නට නො ලැබේ.

ඒ ඇයි ? පිරිමියා පිරිමියෙකු මිස ගැහැනියක නොවිය යුතු සේම ගැහැනියක ගැහැනියකු මිස පිරිමියෙකු නොවිය යුතුය යන්න අපේ සමාජයේ පිළිගැනීම එයට හේතුවයි. කෙසේ වෙතත් කවර සමාජයක උවත් ගෑනු පිරිමින් පිරිමි ගෑනුත් සිටින බව අමතක නොකල යුතුය.

අම්මා ගැහැනියකි. ගෙදර බුදුන් අම්මා යනු අපට ඉක ප්‍රරුදු කියමනකි. තාත්තාට බැරි බොහෝ වැඩ කරන්නේ අම්මාය. තාත්තා කරන බොහෝ වැඩ අම්මාට කරන්නට බැරිය.

දරුවන් වැදීම, වැඩීම, රැක බලා ගැනීම, අහරින් පැනින් උන් සැනැප්වීම, උන් හැලවීම හා සුරතල් කිරීම, සැමියාගේ කටයුතු නොපරිහෙලා ඉටු කිරීම, ගෙදර - දොරේ වත්තේ පිටියේ කෙතේ වැඩට හවිල් වීම අම්මා කෙනෙකුට බාරය.

ලෝකයේ සිදුවන වෙනස් කම්වලට පෙරලිවලට මුහුන නොදී සිටීමේ හැකියාවක් අද අපට නැත. අපේ කත්තු ද එදා තමන්ට පැවරී තිබි කිස ගැන නොතකා පිරිමින් හා හරි හරියට වැඩට බටහ. සමහර විට පිරිමින් අබ්බවා එදා පිරිමින් කල වැඩ අද කරන කතුන් ගැන ද අසන්නට ලැබේ.

පව්ල් ඒකකය ? පව්ලේ එකමුතුව ? සැමියාට යටත්පහත් ව සිටි බිරිය ? දරුවන්ගේ කටයුතු ? ඒ ගැන කතා බහ කිරීම මගේ කාරිය නොවේ. මේ බසේ සැකැස්ම ගැන ලියන ලිපියකි.

අද කතුන් නොකරන වැඩක් නැත. සමහර විට සැමියා ගෙදර නැවතී දරුවන් රැක බලා ගන්නා අතර අඹුව ටැක්සියක් හෝ බසයක් එලවයි (පදවයි). නොහොත් රෝහලක හෝ පොලීසියක සේවය කරයි. මේ වෙනස් කම් නිසා බසේ ද වෙනස් කම් ඇති විය.

හෙදිය බැංකුව අපට හුරු වචන නොවේ. ගුරුවරිය කුවරිය වෙදවරිය (වෛද්‍ය/දොස්තර වරිය වෙදවරියට වඩා ඉහලය) ගුරුතුමිය ඇමතිතුමිය කිව්දිය අපට හුරු පුරුදු වචන නොවේ. මා කියන්නේ එදා ගැනය.

මගේ මතකය අනුව වරියන් තුමියන් ඉදියන් ගැන සඳහන් වී ඇති තැනක් ගැන කීමට නොහැකිය. කාලයට අනුව බසේ ඇති වූ මේ වෙනස්කම් අප පිළිගත යුතුය. ඒවා සිහිමත් ව නිවැරදිව බහවිත කල යුතුය.

සිහිමත් ව නිවැරදිව බස හසුරුවන්නේ කෙසේ ද ? අපි දැන් ඒ ගැන විමසමු.

ගුරුවරයා/වරිය පඬිවරයා/වරිය කව්වරයා/වරිය ඇමතිවරයා/වරිය යන පදවල පිරිමි ගැහැනු වෙනස ඉතා පැහැදිලිය.

ගුරුවරු/වරියෝ පඬිවරු/වරියෝ කව්වරු/වරියෝ ඇමතිවරු/වරියෝ යන පදවල ද ඒ වෙනස පැහැදිලිය.

අම්මාවරු/වරියෝ මව්වරු/වරියෝ නෝනාවරු/වරියෝ මැතිවරු/වරියෝ යනු අවිල් දැලකි.

ඇමති යන්නට 'ඉනි' ප්‍රත්‍ය එකතු කොට 'ඇමතිනි' යන පදය හදා ගත හැකිය. එහෙත් ගරු/ගිරි නොවේ. පඬි/පඬිනි නොවේ. කව්/කවිනි නොවේ. ගෙවිලිය, සරලිය/සුරඟන/සරඹ වැනි වහර ගැන තැකීමක් නැතිව හදා ගත් 'වරි' යන්න නිවැරදිව වහර කරන්නට බැරිකමක් නැත.

අම්මා/මව්/නෝනා (වරිය) වරියෝ යන්නේ ඉතිරි ලිඟු පද තහවුරු කර ඇතැයි සිතමු. ඒ අනුව පිය/මාමා/තාපස (වරයා) වරු යන්නේ පුරුස ලිඟු පද ගහවුරු වී ඇත.

එසේ නම් තාත්තා/පිය (වරිය) වරියෝ යන්නේ ඇති විකාරයම අම්මා/මව් (වරයා) වරු යන්නේ ද ඇති බව ඔබට නොපෙනේද?

අම්මා/මව් යන ඉතිරි ලිඟු පදවලට 'වරු' යන පුරුස ලිඟු පදය එකතු කල පසුත් ඒවා ඉතිරි ලිඟු වේ නම්,

තාත්තා/පිය යන පුරුස ලිඟු පදවලට 'වරියෝ' යන ඉතිරි ලිඟු පදය එක් කල පසුත් ඒවා පුරුස යන ඉතිරි ලිඟු විය යුතුය. එවිටම ඔබට මව්වරුන් සහ පිය වරියන් ද දකිත හැකිය.

වි. ක. ධර්මබන්ධු

මෙල්බන් නගරයේ වෙස්ටන් මහ රෝහලේ ස්නායු රෝග ඒකකයේ ස්නායු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය
තිස්ස විජේරත්න මහතා
විසින් ලියනු ලබන වෛද්‍ය ලිපිය ළබන කළාපයේ
පළ වන බව කරුණාවෙන් සලකන්න

ශ්‍රී ලාංකේය මාධ්‍ය කවුළුව.
ගොඩවන්න අදම
www.thisara.com
තිසර FM 97.4

Lead Accounting & Taxation Services
Public Accountant and Registered Tax Agent
Refunds within 14 days
Tax Returns 2007
ශ්‍රී ලාංකික ඔබට සුහද සේවය
Services
- Individual/ Business/ Investment Property Tax Returns
- Accounting/ Bookkeeping
- Preparation of Business Activity Statements(BAS)
- Audit of Non-for-Profit Organization and Self-Managed Superannuation Funds
- Personal Service and Advice

L. A. Dayananda Wimalasiri PNA
B.Com, M.Com, M.Bus, Ad.Dip.Acct.
Office: 1/1324 Centre Rd, Clayton 3169; TP 03 9544 4995; Fax 03 9544 4997
After Hours: 7 Whitton Court, Rowville 3178; P/F 03 9755 7400; M 0402 846 676
leadtax@iprimus.com.au
NIA NATIONAL INSTITUTE OF ACCOUNTANTS
PNA
Kusumsiri - Lead Design House 0430 112 088